මගේ අංකය :- SP-PSC/32/EB/19/03
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය සංකීර්ණය ,
කළුවැල්ල, ගාල්ල.
2025.05. 21

ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය, දකුණු පළාත.

කොමසාරිස්, සමාජ සුබසාධන,පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව, දකුණු පළාත.

**දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් තනතුරුවල (MN-1) III/II/I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025**

**Efficiency Bar Examination of Non Technical Management Assistants (Grade III/II/I) (MN-1) of Category 2 for the Department of Social Welfare, Probation and Child Care Services in Southern Province - 2025**

1.0 අංක 325 හා 2024.12.11 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් විසින් සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් මෙම කොමිෂන් සභාව විසින් 2025 අගෝස්තු මාසයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| අනු අංකය | තනතුර | තනතුරු නාමය ඉංග්‍රීසියෙන් | ශ්‍රේණිය | | |
|---|---|---|---|---|---|
| 01 | නිවාසාචාර්ය | House Master | | | I |
| 02 | සහකාර නිවාසාචාර්ය | Assistant House Master | III | II | I |
| 03 | මේට්‍රන් | Matron | | | I |
| 04 | සහකාර මේට්‍රන් | Assistant Matron | III | II | I |
| 05 | වෝර්ඩන් | Warden | | | I |
| 06 | සහකාර වෝර්ඩන් | Assistant Warden | III | II | I |
| 07 | පාලිකා | Palika | | | I |
| 08 | සහකාර පාලිකා | Sahakara Palika | III | II | I |
| 09 | නිවාස මාතා | House Mother | III | II | I |
| 10 | වෘත්තීය උපදේශක | Vocational Instructor | III | II | I |
| 11 | පුහුණු ගුරු | Trained Teacher | III | II | I |
| 12 | පෙර පාසල් ගුරු | Pre School Teacher | III | II | I |
| 13 | සාත්තු සේවිකා | Saththu sevika | III | II | I |
| 14 | සංඥා භාෂා පරිවර්තක | Signal Language Translator | III | II | I |

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද හා මධ්‍ය රජයෙන් / වෙනත් පළාත් සභාවලින් දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද ඉහත නිලධාරීන් සඳහා මෙම විභාගය ගාල්ල නගරයේ දී පැවැත්වේ.

2.0 **සුදුසුකම් හා විභාග පරිපාටිය -**

(අ) සුදුසුකම් :- දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු දරණ III/II/I ශ්‍රේණිවල නිලධාරීන් මෙම විභාගය සඳහා සුදුසුකම් ලබයි.

(ආ) විභාග පටිපාටිය :- මෙම විභාගය ලිඛිත විභාගයකි. විෂයය නිර්දේශය පහත සඳහන් පරිදි වේ. සාමාර්ථයක් සඳහා එක් එක් විෂයය සඳහා වූ මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) නිලධාරීන් විසින් ලබා ගත යුතු වේ.

<u>III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

(III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගතවීමට පෙර සමත් විය යුතු ය.)

| | විෂයය | ලකුණු | කාලය |
|---|---|---|---|
| 1. | ආයතන සංග්‍රහය (Establishment Code) | 100 | පැය 03 |
| 2. | දකුණු පළාත් සභා මූල්‍ය රීති (Southern Provincial Council Financial Rules) | 100 | පැය 02 |

විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| විෂයය | විෂයය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය (Establishment Code) | ආයතන සංග්‍රහයේ II, III, IV, VI, VII, XII, XIII , XIV , XVIII, XXI, XXVII, XXVIII යන පරිච්ඡේද හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සියළුම පරිච්ඡේදවලට අදාළව දැනුම පරීක්ෂා කර බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. |
| දකුණු පළාත් සභා මූල්‍ය රීති (Southern Provincial Council Financial Rules) | දකුණු පළාත් සභාවේ පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ IV, V, VI යන පරිච්ඡේදවලට අදාළව දැනුම පරීක්ෂා කර බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. |

<u>II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

**දෙවන කාර්යක්ෂමතා කඩඉමට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබනුයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් හා II වන ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් පමණි.**

(II වන ශ්‍රේණියට උසස්වී වසර 03ක් ගතවීමට පෙර සමත් විය යුතු ය.)

| තනතුර | ප්‍රශ්න පත්‍රය / විෂයය ක්ෂේත්‍රය | ලකුණු | කාලය |
|---|---|---|---|
| සහකාර නිවාසාචාර්ය, සහකාර මේට්‍රන්, සහකාර වෝර්ඩන් | 1. මුල් ළමාවිය සංවර්ධනය (Early childhood development) | 100 | පැය 02 |
| | 2. පෝෂණය, සෞඛ්‍ය, රැකවරණය පිළිබඳ සාමාන්‍ය දැනුම (General knowledge of nutrition, health, care) | 100 | පැය 02 |

| | | | |
|---|---|---|---|
| සහකාර පාලිකා | 1. කාර්යාල ක්‍රම (Office Systems) | 100 | පැය 02 |
| | 2. විෂය පිළිබඳ දැනුම I (Subject Knowledge I) | 100 | පැය 02 |
| නිවාස මාතා | 1. පෝෂණවේදය හා සෞඛ්‍ය (Nutrition and health) | 100 | පැය 02 |
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය (Subjective Studies) | 100 | පැය 02 |
| පෙර පාසල් ගුරු, පුහුණු ගුරු, වෘත්තීය උපදේශක | 1. විෂයානුබද්ධ අධ්‍යයනය I (Subjective Studies I) | 100 | පැය 02 |
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය II (Subjective Studies II) | 100 | පැය 02 |
| සාත්තු සේවිකා | 1. පෝෂණවේදය හා සෞඛ්‍ය (Nutrition and health) | 100 | පැය 02 |
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය (Subjective Studies) | 100 | පැය 02 |
| සංඥා භාෂා පරිවර්තක | 1. විෂයානුබද්ධ අධ්‍යයනය I (Subjective Studies I) | 100 | පැය 02 |
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය II (Subjective Studies II) | 100 | පැය 02 |

විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| තනතුර | ප්‍රශ්න පත්‍රය / විෂයය ක්ෂේත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|---|
| සහකාර නිවාසාචාර්ය, සහකාර මේට්‍රන්, සහකාර වෝර්ඩන් | 1. මුල් ළමාවිය සංවර්ධනය (Early childhood development) | මෙහි මූලික දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. |
| | 2. පෝෂණය, සෞඛ්‍ය, රැකවරණය පිළිබඳ සාමාන්‍ය දැනුම (General knowledge of nutrition, health, care) | මේ පිළිබඳ සාමාන්‍ය දැනුම අපේක්ෂා කෙරේ. |
| සහකාර පාලිකා | 1. කාර්යාල ක්‍රම (Office Systems) | කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, කාර්යාල පටිපාටි, ලේඛන ගොනු කිරීම, ආකෘති පත්‍ර පරිහරණය, ලිපි ගනුදෙනු, රැකියා විස්තර, කාර්යය සාධන මැනීම, කාර්යාලවල ඵලදායිතා වර්ධනය |
| | 2. විෂය පිළිබඳ දැනුම I (Subject Knowledge I) | ඔටිසම් ළමුන් හා විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ සාමාන්‍ය හැසිරීම් රටා අවබෝධය හා ආබාධිත පුනරුත්ථාපනය පිළිබඳ අවබෝධය, 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත හා අදාළ සංශෝධන, ආබාධිත අභ්‍යාසලාභීන්ගේ සෞඛ්‍ය, අධිකරණ කටයුතු පිළිබඳ අවබෝධය, මහජන සම්බන්ධතා පැවැත්වීම. |
| නිවාස මාතා | 1. පෝෂණවේදය හා සෞඛ්‍ය (Nutrition and health) | ළමා සංවර්ධන අවධි අනුව පෝෂණය, ළමා සෞඛ්‍ය ක්‍රියාකාරකම්, ළමා රෝග හා ප්‍රථමාධාර පිළිබඳ දැනුම පරීක්ෂා කර බැලීම. |

| | | |
|---|---|---|
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය (Subjective Studies) | ළමා අයිතිවාසිකම්, ළමා රැකවරණ ක්‍රම , ළමා සංවර්ධනය, ළමා උපදේශනය, ළමයින්ට බලපාන ගැටළු පිළිබඳ සාමාන්‍ය දැනීම. |
| පෙර පාසල් ගුරු | 1. විෂයානුබද්ධ අධ්‍යයනය I (Subjective Studies I) | • ළදරු හා ළමාවියේ දරුවන්ගේ යහපත් මානසික වර්ධනය සඳහා කළ යුතු හා නොකළ යුතු කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුම<br>• යහපත් ළමා ක්‍රියාකාරකම් හා කුසලතා වර්ධනය කිරීම.<br>• ළදරුවන්ගේ මූලික අධ්‍යාපන ක්‍රමවේද පිළිබඳ අවබෝධය<br>• පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ දැනුම<br>• ළදරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය සැලසීම පිළිබඳ ක්‍රමවේද |
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය II (Subjective Studies II) | ළමා අයිතිවාසිකම්, ළමා රැකවරණ ක්‍රම, ළමා සංවර්ධනය, ළමා උපදේශනය, ළමයින්ට බලපාන ගැටළු පිළිබඳ සාමාන්‍ය දැනීම. |
| පුහුණු ගුරු | 1. විෂයානුබද්ධ අධ්‍යයනය I (Subjective Studies I) | ශ්‍රී ලංකාවේ ළමුන් මුහුණපාන ගැටලු හා ඊට අදාළ විසඳුම්<br>ළමුන් ආයතනගත වීමට බලපාන හේතු<br>එක්සත් ජාතීන් විසින් 1989 ප්‍රකාශයට පත් කරන ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය |
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය II (Subjective Studies II) | නොවිධිමත් අධ්‍යාපන ක්‍රම පිළිබඳ අවබෝධය<br>ළමා මනෝ විද්‍යාව, අධ්‍යාපන මනෝ විද්‍යාව පිළිබඳ දැනුම |
| වෘත්තීය උපදේශක | 1. විෂයානුබද්ධ අධ්‍යයනය I (Subjective Studies I) | විෂය ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය දැනුම පරීක්ෂා කර බැලීම. |
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය II (Subjective Studies II) | නොවිධිමත් අධ්‍යාපන ක්‍රම පිළිබඳ අවබෝධය<br>ළමා මනෝ විද්‍යාව, අධ්‍යාපන මනෝ විද්‍යාව පිළිබඳ දැනුම |
| සාත්තු සේවිකා | 1. පෝෂණවේදය හා සෞඛ්‍ය (Nutrition and health) | රෝගීන්ගේ පෝෂණය, සෞඛ්‍ය ක්‍රියාකාරකම්, රෝග හා ප්‍රථමාධාර පිළිබඳ දැනුම පරීක්ෂා කර බැලීම. |
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය (Subjective Studies) | දරුවන්, වැඩිහිටියන් හා රෝගීන් රැකබලා ගැනීම පිළිබඳ සාමාන්‍ය දැනුම |
| සංඥා භාෂා පරිවර්තක | 1. විෂයානුබද්ධ අධ්‍යයනය I (Subjective Studies I) | විෂය ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය දැනුම පරීක්ෂා කර බැලීම. |
| | 2. විෂයානුබද්ධ අධ්‍යයනය II (Subjective Studies II) | කිසියම් ප්‍රකාශයක් හෝ සාකච්ඡාවක සටහනක් කියවා අවබෝධ කර ගෙන ලිපියක් හෝ වාර්තාවක් පිළියෙල කිරීම.<br>කාලීන සමාජීය සිදුවීම් පිළිබඳව අවබෝධ කරගෙන විග්‍රහ කර දැක්වීම පිළිබඳ හැකියාව පරීක්ෂා කර බැලීම. |

**<u>I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>**

**තෙවන කාර්යක්ෂමතා කඩඉමට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබනුයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් හා I වන ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් පමණි.**

(I වන ශ්‍රේණියට උසස්වී වසර 05ක් ගතවීමට පෙර සමත් විය යුතු ය.)

| තනතුර | ප්‍රශ්න පත්‍රය / විෂයය ක්ෂේත්‍රය | ලකුණු | කාලය |
|---|---|---|---|
| මේට්‍රන්/ වෝර්ඩන්/ නිවාසාචාර්ය/ සහකාර නිවාසාචාර්ය/ සහකාර මේට්‍රන් / සහකාර වෝර්ඩන්/ නිවාස මාතා / පෙර පාසල් ගුරු / පුහුණු ගුරු/ වෘත්තීය උපදේශක/ සාත්තු සේවිකා/සංඥා භාෂා පරිවර්තක | 1. ආඥා පනත් හා දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග (Ordinances & Departmental Standing Orders) | 100 | පැය 03 |
| | 2. සාමාන්‍ය දැනීම I (General Knowledge I) | 100 | පැය 02 |
| | 3. සාමාන්‍ය දැනීම II (General Knowledge II) | 100 | පැය 02 |
| පාලිකා/ සහකාර පාලිකා | 1. කාර්ය විශේෂිත දැනුම (Task Specific Knowledge) | 100 | පැය 02 |
| | 2. විෂය පිළිබඳ දැනුම II (Subject Knowledge II) | 100 | පැය 02 |

විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| තනතුර | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| මේට්‍රන්/ වෝර්ඩන්/ නිවාසාචාර්ය/ සහකාර නිවාසාචාර්ය/ සහකාර මේට්‍රන්/ සහකාර වෝර්ඩන්/ නිවාස මාතා/ පෙර පාසල් ගුරු/ පුහුණු ගුරු/ වෘත්තීය උපදේශක | 1.ආඥා පනත් හා දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග (Ordinance & Department Standing Orders) | (අ) ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත<br>(ආ)වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනත<br>(ඇ)අනාථ ළමා නිවාස ආඥා පනත<br>(ඈ)ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥා පනත<br>(ඉ) තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල ආඥා පනත<br>(ඊ) අයාල ආඥා පනත<br>(උ) නිවර්තන නිවාස ආඥා පනත<br>(ඌ)ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>(එ) දණ්ඩ නීති සංග්‍රහය 1995 අංක 22 හා 1998 අංක 29 සංශෝධනය<br>(ඒ) දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ ළමුන් භාර ගැනීමේ ළමා නිවාස, රැඳවුම් නිවාස, සහතික කළ පාසල් වලට අදාළ දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග පිළිබඳ සාමාන්‍ය දැනුම |
| | 2.සාමාන්‍ය දැනීම I (General Knowledge I) | ශ්‍රී ලංකාවේ පවත්නා අර්බුද හා ගැටලු පවුලට හා ළමයාට බලපා ඇති ආකාරය, ළමා අපචාර ඇති වීමට හේතු හා ඒවා වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳ සාමාන්‍ය දැනීම ප්‍රශ්න තුළින් විමසා බලනු ලැබේ. |

| | | |
|---|---|---|
| | 3.සාමාන්‍ය දැනීම II<br>(General Knowledge II) | කණ්ඩායමක සාමාජිකයෙකු සේ වැඩ කිරීම, කණ්ඩායම් නායකත්වය, ආයතනයක ව්‍යුහය, ආයතනික රැකවරණය, වැඩ පැවරීම, ළමා හා යෞවන අවශ්‍යතා, වාර්තාකරණය යන අංශවල විෂයය දැනුම පරීක්ෂා කර බැලීම සඳහා වන ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| පාලිකා/<br>සහකාර<br>පාලිකා | 1. කාර්ය විශේෂිත දැනුම<br>(Task Specific Knowledge) | කාර්යාලවල පරිසරයට අදාළ වන ගැටලුවකට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධය, විශේෂ අවශ්‍යතා ඇති අයගේ මනෝ මූලිකව ගොඩනැගෙන ගැටලු හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම හා නිරීක්ෂණය කර ගැනීම. |
| | 2. විෂය පිළිබඳ දැනුම II<br>(Subject Knowledge II) | ආබාධිත බව පිළිබඳ සමාජ ආකල්ප හා ආබාධ සහිත ප්‍රජාව සමාජගත කිරීමේ ක්‍රියාවලියේදී ඇතිවන බලපෑම් පිළිබඳ අවබෝධය, ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියේ පරමාර්ථ හා ආබාධිතභාවය පිළිබඳ නිර්වචනය, නිවාසගත ආබාධිත අභ්‍යාසලාභීන් මුහුණදිය හැකි හදිසි අනතුරු වළක්වා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධය |
| සාත්තු<br>සේවිකා | 1.ආඥා පනත් හා දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග<br>(Ordinance & Department Standing Orders) | (අ) අයාල ආඥා පනත<br>(ආ) නිවර්තන නිවාස ආඥා පනත<br>(ඇ) දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග පිළිබඳ සාමාන්‍ය දැනුම |
| | 2.සාමාන්‍ය දැනීම I<br>(General Knowledge I) | ශ්‍රී ලංකාවේ පවත්නා අර්බුද හා ගැටළු පවුලට හා වැඩිහිටියන්ට බලපා ඇති ආකාරය, වැඩිහිටියන් හුදෙකලා වීම, අපචාරවලට නැඹුරු වීමට හේතු හා ඒවා වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳ සාමාන්‍ය දැනීම ප්‍රශ්න තුළින් විමසා බලනු ලැබේ. |
| | 3.සාමාන්‍ය දැනීම II<br>(General Knowledge II) | කණ්ඩායමක සාමාජිකයෙකු සේ වැඩ කිරීම, කණ්ඩායම් නායකත්වය, ආයතනයක ව්‍යුහය, ආයතනික රැකවරණය, වැඩ පැවරීම, දරුවන්ගේ වැඩිහිටියන්ගේ හා රෝගීන්ගේ අවශ්‍යතා යන අංශවල විෂයය දැනුම පරීක්ෂා කර බැලීම සඳහා වන ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| සංඥා භාෂා<br>පරිවර්තක | 1.ආඥා පනත් හා දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග<br>(Ordinance & Department Standing Orders) | (අ) ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත<br>(ආ)වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනත<br>(ඇ) අනාථ ළමා නිවාස ආඥා පනත<br>(ඈ) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥා පනත<br>(ඉ) තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල ආඥා පනත<br>(ඊ) අයාල ආඥා පනත<br>(උ) නිවර්තන නිවාස ආඥා පනත<br>(ඌ)ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>(එ) නිවර්තන නිවාස ආඥා පනත<br>(ඒ) දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග පිළිබඳ සාමාන්‍ය දැනුම |

| | | |
|---|---|---|
| | 2.සාමාන්‍ය දැනීම I<br>(General Knowledge I) | විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට හා වැඩිහිටියන්ට බලපාන සමාජයීය ගැටළු, ළමා හා යෞවන අවශ්‍යතා, විශේෂ අවශ්‍යතා සහිත ළමයින් හා වැඩිහිටියන් අපචාරවලට ගොදුරු වීමට හේතු හා ඒවා වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳ සාමාන්‍ය දැනුම විමසා බලනු ලැබේ. |
| | 3.සාමාන්‍ය දැනීම II<br>(General Knowledge II) | කණ්ඩායමක සාමාජිකයෙකු සේ වැඩ කිරීම, කණ්ඩායම් නායකත්වය, ආයතනයක ව්‍යුහය, ආයතනික ඒකවරණය, වැඩ පැවරීම, වාර්තාකරණය යන අංශවල විෂයය දැනුම පරීක්ෂා කර බැලීම සඳහා වන ප්‍රශ්නවලින් සමන්විත වේ. |

2.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පැවැත්වේ. අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

2.2 තමන් කැමති නම් එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකි වේ. සාමාර්ථයක් සඳහා එක් එක් විෂයය සඳහා වූ මුළු ලකුණුවලින් අවම වශයෙන් 40% ක් නිලධාරීන් විසින් ලබා ගත යුතු වේ.

3.0 විභාග ප්‍රතිඵල - දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් වෙත තැපැල් මඟින් හා සියලුම අයදුම්කරුවන් වෙත මෙම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා නිකුත් කරනු ඇත.

4.0 විභාග ගාස්තු -

පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිඳු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවල දී විභාගය සඳහා පෙනී සිටින නිලධාරීන් විසින් පෙනී සිටින එක් විෂයයක් සඳහා රු. 250/-ක් බැගින්, මාර්ගගත ව (Online) විභාග ගාස්තු ගෙවිය යුතු වේ.

සියලුම ගෙවීම් සිදුකළ යුත්තේ **VISA** හෝ **MASTER** කාඩ්පත් මඟින් පමණක් වන අතර, ඒ හැර වෙනත් ක්‍රමයක් මඟින් සිදු කරනු ලබන ගෙවීම් කිසිඳු ආකාරයකින් පිළිගනු නොලැබේ. කිසිඳු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බව ද සැලකිය යුතු ය.

5.0 අයදුම්කළ යුතු පිළිවෙල -

සියලුම අයදුම්කරුවන් www.psc.sp.gov.lk යන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස විභාගය නිවැරදි ව තෝරා, අදාළ තොරතුරු ඇතුළත් කර විභාග ගාස්තු ගෙවීමෙන් පසු ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සඳහා යොමු කළ යුතු ය. ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියා අදාළ තොරතුරු පරීක්ෂාකර මාර්ගගතව නිර්දේශය ලබා දීමෙන් පසු අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කළ යුතු ව ඇත. මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ කාල සීමාව 2025 ජුනි 11 වන දින ප.ව. 11.59 න් අවසන් වේ. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිත කිරීම වඩාත් සුදුසු වේ.)

5.1 අයදුම්කරු විසින් ම මෙම විභාගය සඳහා තම අයදුම් පත්‍රය මාර්ගගතව සම්පූර්ණ කළ යුතු අතර, කිසිදු නිලධාරියෙකු වෙනත් නිලධාරියෙකුගේ අයදුම්පතක් එම නිලධාරියාගේ අනුදැනුමකින් තොරව සම්පූර්ණ නොකළ යුතු ය.

5.2 අයදුම්කරුවන් විසින් ඇතුළත් කරනු ලබන කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එබැවින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කිරීමට පෙර එම තොරතුරු හොඳින් පරීක්ෂා කිරීම වැදගත් වනු ඇත.

5.3 වෙනත් ක්‍රම මගින් ඉදිරිපත් කරන අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. මාර්ගගතව මෙම විභාගය සඳහා අයදුම් කිරීමේදී වැරදි විභාගයක් තේරීම වැනි අතපසුවීම්වලින් සිදුවන පාඩුව ඔබ විසින් විඳදරා ගත යුතු වේ.

## 6.0 ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -

විභාගය සඳහා අයදුම් කිරීමේ කාලය අවසන් වීමෙන් පසු දින 02ක කාලයක් තුළ එනම්, **2025 ජූනි 13 වන දින ප.ව. 11.59 දක්වා** අයදුම්පත් මාර්ගගතව නිර්දේශ කිරීමේ අවස්ථාව පවතී. ඒ සඳහා අදාළ ආයතනය විසින් නම් කළ මාණ්ඩලික නිලධාරියා විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ඇති විභාග අයදුම්පත් නිර්දේශ කිරීමේ කවුළුවට පිවිස (Main menu > Exams > Coordinator Login) අදාළ විභාගය තෝරා තම ආයතනය යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පරීක්ෂාකර බලා නිර්දේශ කිරීමේ හැකියාව පවතී.

6.1 අයදුම්කරුවන් විසින් සපයා ඇති සියලු තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් අනතුරු ව අයදුම්පත් නිර්දේශ කළ යුතු අතර, යම් හෙයකින් සාවද්‍ය තොරතුරු ඇතුළත් කර තිබියදී අයදුම්පත් නිර්දේශ කර ඇත්නම් ඒ පිළිබඳ වගකීම අදාළ මාණ්ඩලික නිලධාරියා විසින් දැරිය යුතු වේ. අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වන අතර, නිර්දේශ නොකරන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු ලෙසකිනුදු නැවත සලකා බැලීමක් සිදු නොකෙරේ.

6.2 නිර්දේශ කිරීමේ කාලසීමාව අවසන් වූ පසු ස්වයංක්‍රීයව එම කවුළුව ක්‍රියා විරහිත වන අතර, නිර්දේශ නොකරන ලද අයදුම්පත් සියල්ල දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වීමකින් තොරව ප්‍රතික්ෂේප වනු ඇත.

6.3 සියළු අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු, නිර්දේශිත අයදුම්පත් නාම ලේඛනය එම ස්ථානයෙන්ම බාගත කර ගත හැකි අතර, එය මුද්‍රණය කර මෙම කොමිෂන් සභාව වෙත තැපැල් මගින් එවීමට කටයුතු කළ යුතු ය.

6.4 ආයතනික කටයුතු සඳහා අයදුම්පත බාගත කර මුද්‍රණය කර ගත හැකි අතර, කිසිදු ලෙසකින් අයදුම්පතේ දෘඩ පිටපත් මෙම කොමිෂන් සභාව වෙත එවීම නොකළ යුතු ය.

## 7.0 ප්‍රවේශ පත්‍ර -

නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත් මාර්ගගත ව ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk ඔස්සේ මාර්ගගත ව ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව ඔබ ආයතනයේ සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියා වෙත කෙටි පණිවිඩයක් මගින් දැනුම් දෙනු ලබන අතර, වෙබ් අඩවියේ ඇති විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ කවුළුවට පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගත හැකිය.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය. බාගත කර ගන්නා ලද විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් මුද්‍රණය කර, ආයතනයේ ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු මඟින් අත්සන සහතික කරවා විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිඳු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) ජාතික හැඳුනුම්පත

(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(iii.) වලංගු රියදුරු බලපත්‍රය

8.0 **සාවද්‍ය තොරතුරු සැපයීම** - මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. තව ද කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට මෙම කොමිෂන් සභාවට බලය ඇත.

9.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10.0 විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට අනුශාංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සී.පී. රාජකරුණා**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත.

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

(**සැලකිය යුතුයි** - ඔබ ආයතනයට අනුබද්ධ ශාඛා කාර්යාල හෝ උප කාර්යාලවල සේවයේ නියුතු මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබන නිලධාරීන් සිටී නම් කරුණාකර ඔවුන් දැනුම්වත් කිරීමට කටයුතු කරන්න.)